00015

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - හයවන මට්ටම 2014/2015

අවසාන පරීක්ෂණය - 2016

ප්‍රාථමික අධ්‍යාපනය – ESU4117

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2016 අප්‍රේල් 08 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ප්‍රාථමික අධ්‍යාපනයේ පුළුල් පරමාර්ථ දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

02. "සහභාගිත්වය සඳහා ළමා අයිතිය " යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

03. 'සැමට අධ්‍යාපනය' සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාථමික අධ්‍යාපන අවධියේදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ වැදගත්කම පෙන්වා දෙන්න.

05. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් ප්‍රාථමික අවධියේදී ශිෂ්‍යයා විසින් ගොඩනගාගත යුතු ඉගෙනුමෙහි මූලික ස්ථම්භ පහ (05) දක්වන්න.

06. ඉගෙනුම සඳහා ප්‍රාථමික සිසුන් විසින් භාවිත කරනු ලබන ශිල්පීය ක්‍රම තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

07. "සැමදා වෙනස්වන ලෝකයේ අභියෝග හමුවේ බොහෝදුරට නම්‍යශීලිවීමට ළමයාට පුහුණුවක් දිය යුතු වේ." මෙය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික අවධියට ප්‍රවේශ මට්ටමේදී ශිෂ්‍ය නිපුණතා හඳුනාගැනීමේ වැදගත්කම නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පෙස්ටලෝසිගේ අධ්‍යාපන දර්ශනයේ මූලික සත්‍යයන් දෙක (02) නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) 1997 ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කෙරෙහි දාර්ශනික අදහස් ඇති කළ බලපෑම විමසන්න. (ලකුණු 10)

10. (i) ප්‍රාථමික අධ්‍යාපනය සැපයීමේදී සාධාරණත්වය හා සමානාත්මතාවය පවත්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව අද මුහුණ පා ඇති අභියෝග විමසන්න. (ලකුණු 08)

(ii) පන්තිකාමරය තුළ ගුරුවරයකු වශයෙන් සාධාරණත්වය හා සමානාත්මතාව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) උදාහරණ දක්වමින් (අවම වශයෙන් එක් උදාහරණයක්) පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (i) 1997 විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී සැළකිල්ලට ගත් මූලික නිපුණතා පහ (05) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) නිදසුන් දක්වමින් එක් එක් නිපුණතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) (අ) ඉහත මූලික නිපුණතා අත්කර ගැනීමට ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුවාට බාධා කෙරෙන සාධක තුනක් (03) දක්වන්න. (ලකුණු 03)

(ආ) එම බාධා මැඩපවත්වා ගනිමින් සිසුනට මූලික නිපුණතා අත්කර ගැනීමට, ගුරුවරයාට සහය විය හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

12. (i) ප්‍රාථමික අධ්‍යාපන අවධියෙහි දරුවකුගේ සමාජයීය හා චිත්තවේග සංවර්ධනය සඳහා ඉගෙනුම් පරිසරයේ බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) සමාජයීය හා චිත්තවේග සංවර්ධනය සඳහා ඵලදායී ඉගෙනුම් පරිසරයක් පවත්වාගෙන යාමේදී ප්‍රාථමික ගුරුවරයාගේ භූමිකාව විමසන්න. (ලකුණු 10)

00015

13. (i) ඉගෙනුම් සම්පත් කළමනාකරණය යනුවෙන් කුමක් අදහස් වේද ? (ලකුණු 05)

(ii) ඉගෙනුම් සම්පත් කළමනාකරණයේදී ඔබ,

(අ) සමාන්තර පන්තිවල අනෙක් ගුරුවරුන් සමඟ

(ආ) පාසල් කළමනාකරණය සමඟ

(ඇ) දෙමව්පියන් සහ පාසල් ප්‍රජාව සමඟ

කටයුතු කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

14. (i) ප්‍රාථමික අවධියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලය සඳහා තක්සේරුකරණයේ වැදගත්කම නිදසුන් (අවම වශයෙන් දෙකක් (02) වත්) ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 06)

(ii) ප්‍රාථමික ඉගෙනුම් ක්‍රියාවලිය තක්සේරුකරණයේදී විධිමත් ක්‍රමවේද/උපකරණවලට වඩා අවිධිමත් ක්‍රමවේද/උපකරණ වැදගත් වේ. මෙය විමසන්න. (ලකුණු 08)

(iii) නිපුණතා පාදක ඉගෙනුම් ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා ප්‍රාථමික විෂයමාලාව තුළ තක්සේරුකරණයට අදාළව සිදුකර ඇති නවීකරණ දෙකක් (02) විස්තර කරන්න.

(ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.